## ශේෂය මාරුකිරීම හරහා වැඩි ඉතිරියක්

HSBC ක්‍රෙඩිට් කාඩ්පත ඔබට වැඩි ඉතිරියක් සමග වැඩි වැඩියෙන් භුක්ති විඳීමේ අවස්ථාව ලබා දේ! ඔබගේ අනෙකුත් ක්‍රෙඩිට් කාඩ්පත්වල ගෙවීමට නියමිත ශේෂයන් ඔබේ HSBC ක්‍රෙඩිට් කාඩ්පතට මාරු කිරීමේ අවස්ථාව ලබාදෙන HSBC හි ශේෂය මාරුකිරීමේ වැඩසටහන ඉතා සුවිශේෂී ය. ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත්වල ගෙවීමට නියමිත ශේෂයන් ඒකාබද්ධ කරන අතර ම, ඔබට වැඩි ඉතිරියක් භුක්ති විඳීමේ අවස්ථාව මේ හරහා ඔබ වෙත ලබා දේ.

**මට කොපමණ මුදලක් මාරු කළ හැකි ද?**

ඔබගේ කාඩ්පතෙහි ගෙවීමට නියමිත ශේෂය අඩු කළ පසු, අවමය රු.25,000/-ට යටත් ව, පවතින ණය සීමාවෙන් 60% දක්වා මාරු කළ හැකි ය.

**මා කළ යුත්තේ කුමක්ද?**

කරුණාකර මේ සමග ඇති අයදුම්පත සම්පූර්ණ කර, ඔබගේ අනෙක් බැංකුවෙහි ඔබගේ මෑත කාලීන ප්‍රකාශනය ඊට අමුණා, අප වෙත ඉදිරිපත් කරන්න.

**මට තෝරාගැනීමට ඇති විකල්පයන් මොනවාද?**

මාස 03ක් සඳහා 0% සහ මාස 06ක් සඳහා 1%

**පියවීම සිදුවන්නේ කෙසේද? කුමන පිළිවෙලකට ද? විශේෂයෙන්ම, මා මිළ දී ගැනීම් සිදු කළ විට**

- අ. මුදල් ගනුදෙනු සඳහා අදාළ ගාස්තු
- ආ. මුදල් ගනුදෙනු
- ඇ. මිළ දී ගැනීමේ ගනුදෙනු සඳහා අදාළ ගාස්තු
- ඈ. මිළ දී ගැනීමේ ගනුදෙනු
- ඉ. වාරික සැලසුම්/කාඩ්පත් ශේෂය මාරුකිරීම (CBT) / මුදල් වාරික සැලසුම (CIP)

උදහරණය- (පහත දැක්වෙන ගණනය කිරීම් පැහැදිලි කිරීම සඳහා පමණි.)

මාස 3ක් සහ මාස 6ක් සඳහා රු. 100,000/- ක කාඩ්පත් ශේෂ මාරුකිරීමේ වැඩසටහන.

| කාලසීමාව | වෙනත් බැංකු ක්‍රෙඩිට් කාඩ්පතක හිඟ මුදල | අනෙක් බැංකුවේ පොලිය සළකාබලන කාලසීමාව සඳහා වාර්ෂිකව 24% | HSBC පොලිය | ඉතිරිකිරීම |
|---|---|---|---|---|
| මාස 3 | රු. 100,000/- | රු. 6,000/- | 0% | රු. 6000/- |
| මාස 6 | රු. 100,000/- | රු. 12,000/- | 1%-රු.6000/- | රු. 6000/- |

* ඉහත දක්වා ඇත්තේ තාවකාලික ගණනය කිරීමක් වන අතර, ගෙවීම්/දින ගණන සම්බන්ධයෙන් ඔබගේ අනෙක් බැංකුව විසින් භාවිත කරනු ලබන ගණනය කිරීමේ ක්‍රමවේදය මත එය වෙනස්විය හැකිය.

**වැඩි විස්තර සඳහා කරුණාකර අංක 4 4722 11 හරහා අප අමතන්න**

## ශේෂය මාරුකිරීමේ අයදුම්පත

මෙම ඉල්ලීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා කරුණාකර මෙම පෝරමයෙහි ඉල්ලා ඇති සියලු තොරතුරු සම්පූර්ණ කිරීමට වගබලා ගන්න.

ඔබේ පුද්ගලික තොරතුරු

☐ මයා ☐ මිය ☐ මෙනෙවිය ☐ ආචාර්ය ☐ වෙනත්, කරුණාකර සඳහන් කරන්න …………..
සම්පූර්ණ නම (අනෙක් බැංකුවෙහි ක්‍රෙඩිට් කාඩ්පතෙහි දැක්වෙන ආකාරයට)
☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐

දුරකථන අංකය ……………………………………………………………………..
විද්‍යුත් තැපැල් ලිපිනය …………………………………………………………..

**HSBC ක්‍රෙඩිට් කාඩ්පතෙහි තොරතුරු**
කාඩ්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐
අවලංගු වන දිනය ☐☐☐☐☐☐

**වෙනත් බැංකුවක කාඩ්පතෙහි තොරතුරු**
කාඩ්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐
අවලංගු වන දිනය ☐☐☐☐☐☐

OBC නිකුත් කළ අයගේ නම …..……………..……………..…………
{කරුණාකර අනෙක් බැංකුවේ කාඩ්පතට (OBC) අදාළ මෑත කාලීන ප්‍රකාශනයක් අමුණන්න}

මාරු කළ යුතු මුදල ඃ රු. ........................ (නීතිරීති සහ කොන්දේසි වලට යටත් ව, අවම මුදල රු. 25,000/කි)

මාරු කළ යුතු මුදල සඳහා තෝරාගන්නා සැලසුම

මාස 03ක් සඳහා වාර්ෂිකව පොළිය 0% ☐

මාස 06ක් සඳහා වාර්ෂිකව පොළිය 1% ☐

**නීතිරීති සහ කොන්දේසි**

1. HSBC (බැංකුව) විසින් ශේෂ මාරුකිරීමේ (CBT) වැඩසටහන සකසා ඇත්තේ ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් සඳහා වන අතර, එය බැංකුවේ තනි අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක දී ඉවත්කිරීම හෝ සංශෝධනය කිරීම කළ හැකිය.

2. දක්වා ඇති කාල පරාසය (පිළිවෙලින් මාස 3 ක් හෝ මාස 6ක් ) සඳහා ශේෂ මාරුකිරීමේ මුදලට විශේෂිත මාසික පොළී අනුපාතය (0% සිට 1%දක්වා) අදාළ වනු ඇති අතර, වෙනත් ශේෂයන්ට/ HSBC ක්‍රෙඩිට් කාඩ්පත භාවිතා කර සිදුකරන වෙනත් ගනුදෙනුවලට මෙය අදාළ නොවනු ඇත.

3. සිදුකරන ගෙවීම පළමුවෙන් ශේෂ මාරුකිරීමේ හිඟව ඇති ශේෂය පියවීමට ද ඉන් අනතුරුව සාමාන්‍ය කාඩ්පත් හිඟ මුදල් පියවීමට ද යොදාගන්නා බව කරුණාවෙන් සළකන්න.

4. කාඩ්පත් හිමියාගේ ශේෂ මාරුකිරීමේ ඉල්ලීම අනුමත කරනු ලැබුවහොත් HSBC නියෝජිතයන් සහ කාඩ්පත් හිමියා අතර දුරකථන සංවාදය, ඔහු විසින් වෙනත් ආකාරයකට දක්වා නොසිටියහොත්, ශේෂ මාරුකිරීමේ ගනුදෙනුව සිදුකිරීම සඳහා HSBC බැංකුව වෙත අවසර ලබාදීමක් ලෙස සැලකෙනු ඇත.

5. ඉල්ලා සිටින ශේෂ මාරුකිරීමේ මුදල ආවරණය කිරීම සඳහා කාඩ්පත් හිමියාගේ ණය සීමාව ප්‍රමාණවත් නොවන්නේ නම්, සුදුසු යැයි සිතන ආකාරයකට ශේෂ මාරුකිරීමේ මුදලින් කොටසක් පමණක් තීරණය කර අනුමත කිරීමට HSBC බැංකුව ට අභිමතය පවතියි.

6. ශේෂ මාරුකිරීමේ ඉල්ලීම අනුමත කරනු ලැබූ විට, HSBC විසින් කාඩ්පත් හිමියා වෙනුවෙන් අනුමත කරනු ලැබූ ශේෂ මාරුකිරීමේ මුදල ළඟම ඇති HSBC නොවන ක්‍රෙඩිට් කාඩ්පතෙහි  ගෙවීම් මධ්‍යස්ථානයට ගෙවනු ඇත.

7. කාඩ්පත් හිමියාගේ HSBC නොවන ක්‍රෙඩිට් කාඩ්පතෙහි නියමිත දිනට පෙර ගෙවීම සිදුකිරීමට HSBC අසමත්වීම හෝ ප්‍රමාද වීමෙහි ප්‍රතිඵලයක් ලෙස කාඩ්පත් හිමියාට ඇතිවන පොළී, ක්‍රෙඩිට් කාඩ්පත් ශේෂයට අධික ගෙවීමක්, ප්‍රමාද වී ගෙවීමක් හෝ වෙනත් මූල්‍ය ගාස්තුවක් යන ඕනෑම හෝ සියළුම හානි සම්බන්ධයෙන් බැංකුව හානිපූරණය කෙරෙනු ඇත.

8. ශේෂ මාරුකිරීමේ මුදල සඳහා රිවෝඩ්ස් හෝ මයිලේජ් රිවෝඩ්ස් ලකුණු එකතු නොවෙනු ඇත.

9. බැංකුව විසින් වෙනත් ආකාරයකින් දක්වා නොසිටියහොත්, ශේෂ මාරුකිරීමේ ඉල්ලීම, එම ඉල්ලීම් අයදුම්පත බැංකුව වෙත ලැබීමේ සිට වැඩකරන දින තුනක් තුළ ඉටුකෙරෙනු ඇත.

10. කාඩ්පත් ගිණුමෙහි ණය සීමාව ශේෂ මාරුකිරීමේ මුදලෙහි ප්‍රමාණයට අඩුකිරීම/අවහිර කිරීම සිදුකෙරෙනු ඇති අතර, පසු මාසවල දී මාසික වාරික බිල්ගත කර ගෙවනු ලැබූ විට එය නිදහස් කෙරෙනු ඇත.

11. වාරික වලින් කිසිවක් ගෙවීම කාඩ්පත් හිමියා විසින් පැහැර හරිනු ලැබුවහොත් හිඟව ඇති ශේෂ මාරුකිරීමේ මුදල නවතා දැමීමට සහ සම්පූර්ණ හිඟ මුදල හර කිරීමට HSBC අයිතිය රඳවා ගනියි.

12. කාඩ්පතෙහි හිඟ මුදල ඉක්මවා සිදුකරන ගෙවීම්, බිල්ගත නොකළ වාරික සඳහා ස්වයංක්‍රීයව යෙදවීමක් නොකොරන අතර, එබැවින් එය ශේෂ මාරුකිරීමේ වැඩසටහනෙහි පූර්ව ගෙවීමක් නොවනු ඇත.

13. සියලුම වාරික කාඩ්පත් ගිණුමට යැවීමට කලින් කාඩ්පත් හිමියා සිය කාඩ්පත වසා දැමුවහොත් හිඟව ඇති ශේෂ මාරුකිරීමේ මුදල තනි සමස්ත මුදලක් ලෙස කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත.

14. මෙම නීතිරීති සහ කොන්දේසි වල අඩංගු කිසිවක්, ඉහත කී අර්පණය වසා දැමීමේ දිනයට පසුව කාඩ්පත් වාරික සැලසුම් පහසුකම අඛණ්ඩව සැපයීමට HSBC වෙත පවතින බැඳීමක් ලෙස අර්ථනිරූපනය නොකෙරෙනු ඇත.

15. කාඩ්පත් හිමියා විසින් මෙම කාඩ්පත් වාරික සැලසුම් පහසුකම ලබාගැනීම තුළින් කාඩ්පත් හිමියාට ඇතිවන හෝ දැරීමට සිදුවන යම්කිසි නඩු, අයැදීම්, ඉල්ලීම්, හානි, පාඩු,

පිරිවැය, ගාස්තු හා වියදම් සම්බන්ධව HSBC වගකීමකට හෝ වගවීමකට ලක් නොකෙරෙනු ඇත.

16. මෙම අර්පණයේ නීතිරීති කාඩ්පත් ගිවිසුමේ අඩංගු වන නීතිරීති වලට අතිරේකව වන අතර ඒවා දුර්වල කිරීමක් සිදු නොවේ. මෙම අර්පණය, තෝරාගත් කාඩ්පත් හිමියන්ට ලබාදෙන විශේෂ පහසුකමක් වන අතර, මෙහි අඩංගු කිසිවක් මඟින් කාඩ්පත් ගිවිසුමෙහි ඇති නීතිරීති සහ කොන්දේසි වලට අගතියක් හෝ බලපෑමක් සිදු නොවනු ඇත.

---------------------------------------------------------------------------------------

**ප්‍රකාශනය**

දැනට බලපැවැත්වෙන ශේෂ මාරුකිරීමේ වැඩසටහනෙහි නීතිරීති සහ කොන්දේසි මා විසින් කියවා තේරුම්ගත් බව සහ එකී නීතිරීති සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට මම එකඟ වන බව තහවුරු කරමි.

__________________________ ___________________

කාඩ්පත් හිමියාගේ අත්සන දිනය

**බැංකුවේ භාවිතය සඳහා පමණි**

දත්තා පරීක්ෂා කරන ලදී ☐

ඇතුළත් කළේ _____________________

දිනය _____________________

ණය සීමාව _____________________

ගෙවීමට ඇති (O/s) ශේෂය _____________________

අනුමත මුදල _____________________

බැංකුවෙහි බලයලත් නිලධාරියාගේ අත්සන _____________________

**අද ම, ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත් ශේෂයන් ඒකාබද්ධ කර,**

**වැඩි ඉතිරියක් සහ පහසුවක්**

**භුක්ති විඳින්න**